ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක - 14/2022

මගේ අංකය - HA/02/33-I
ස්වදේශ කටයුතු අංශය,
"නිල මැදුර" , ඇල්විටිගල මාවත,
කොළඹ 05.
2022.11.10

අතිරේක ලේකම් (පාලන) රාජ්‍ය පරිපාලන,
අතිරේක ලේකම් (පාලන) ස්වදේශ කටයුතු,
අතිරේක ලේකම් (පාලන) පළාත් සභා හා පළාත් පාලන,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>SYSCGAA මාර්ගගත කාර්යාල කළමනාකරණ පද්ධතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීම.</u>**

මේ වන විට SYSCGAA මාර්ගගත කාර්යාල කළමනාකරණ පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කල හැකි බව අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයෙන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දියත් කළ නියමු ව්‍යාපෘතිය තුළින් හඳුනාගෙන ඇත. එමෙන්ම මෙම ව්‍යාපෘතිය ආරක්ෂිත ව්‍යාපෘතියක් බවට ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SL-CERT) විසින් සහතික කර ඇත.

02. ඒ අනුව, නිවාඩු ලබා ගැනීම, ඉදිරි වැඩසටහන් සහ කළ වැඩසටහන් අනුමැතියට ඉදිරිපත් කිරීම මෙම පද්ධතිය තුළින් පමණක් ඉදිරියට ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

03. මෙම පද්ධතිය හරහා නිවාඩු, ඉදිරි වැඩසටහන් සහ කළ වැඩසටහන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අනවශ්‍ය මුද්‍රණ වියදම් අවම කර ගැනීමට කටයුතු කර රාජ්‍ය වියදම් අවම කරගන්නා ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි. නිවාඩු සම්බන්ධ අත්‍යවශ්‍ය මාසික හා වාර්ෂික සාරාංශ වාර්තා පමණක් මුද්‍රණය කර අවශ්‍ය ගොනු වලට ඇතුලත් කර තැබීම ප්‍රමාණවත් වේ. මෙම SYSCGAA දත්ත පද්ධතිය විගණනය කිරීම සඳහා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් විගණකවරුන්ට වෙනම පරිශීලක ගිණුම් විවෘත කර දී ප්‍රවේශ පහසුකම් සලසා ඇති බැවින් ඉහත මොඩියුල සම්බන්ධ විගණන කටයුතු මාර්ගගත ක්‍රමවේද තුළින් ඉටු කළ යුතුය.

04. දත්ත පද්ධතිය උපරිම ලෙස භාවිත කරනු ලබන නිලධාරීන් දත්ත පද්ධතිය තුළින්ම හඳුනාගෙන ඉදිරියේදී වඩාත් කාර්යක්ෂම සේවා සපයනු ලබන ආයතන ප්‍රමුඛතාගත කිරීමටත්, ඒ අනුව ඇගයීම් සිදු කිරීමටත් කටයුතු කරනු ඇත.

05. තවද, මෙම මොඩියුලයන්ට අමතරව ඔබ වෙතින් ලද අදහස් සහ යෝජනා අනුව නව මොඩියුලයන් වැඩිදුරටත් සංවර්ධනය කෙරෙමින් පවතින අතර, ඒ අනුව, යාවත්කාලීන කරන ලද එම මොඩියුලයන් නුදුරේදී ඉදිරිපත් කිරීමටද නියමිතය.

06. පද්ධතිය සම්බන්ධයෙන් ඔබට ගැටලු හෝ යෝජනා පවතින්නේ නම් syscgaasystem@gmail.com යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**එම්.එම්.පී.කේ. මායාදුන්නෙ**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
දුරකථන : +94 11 2050363
ෆැක්ස් : +94 11 2369832
විද්‍යුත් ලිපිනය : diviadmin@moha.gov.lk